PN/SSCL/2022-02
2022.10.07

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## බදු ගෙවන්නන් සඳහා වන නිවේදනයයි

## සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචිවීම

යම් ද්‍රව්‍යයක් ආනයනය කරනු ලබන තැනැත්තෙකු හැර සෑම බදු අය කළ හැකි තැනැත්තෙකුම (2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 2 වන වගන්තියේ සඳහන් කරනු ලබන) සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචිවීම අවශ්‍ය වේ.

i. 2021.10.01 වන දින සිට 2022.09.30 වන දින දක්වා වන කාලපරිච්ඡේදය සඳහා සමුච්චිත පිරිවැටුම (මුළු පිරිවැටුම - නිදහස් කර ඇති ද්‍රව්‍ය හෝ සේවා වලින් වන පිරිවැටුම) රුපියල් මිලියන 120 ඉක්මවන්නේ නම්, එවැනි තැනැත්තෙකු 2022 ඔක්තෝම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර ලියාපදිංචිවීම සඳහා අයදුම් කළ යුතුය
ii. තැනැත්තෙකු ඉහත අයිතම (i) යටතට අයත් නොවේ නම්, එවැනි තැනැත්තෙකු, පිරිවැටුම කාර්තුවකට රුපියල් මිලියන 30 ඉක්මවන දිනයේ සිට දින 15 ක් ඇතුළත ලියාපදිංචිය සඳහා අයදුම් කළ යුතුය.

1. **බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් සහිත තැනැත්තන්** (TIN)

- **බදු වර්ග ලියාපදිංචි වීමේ ආකෘතිය [TPR_005 (SSCL)]** නිසි පරිදි සම්පූර්ණ කර පහත පරිදි භාරදීමෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචිය ලබාගත හැකිය:-
  - ප්‍රධාන කාර්යාලයේ, බාලදක්ෂ ගොඩනැගිල්ලේ හෝ මෙහෙවර පියසෙහි (නාරාහේන්පිට) ආදායම් බදු ගොනු පවත්වාගෙන යන්නේ නම් කොමසාරිස්, බදු ලියාපදිංචි අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 02.
  - නගරබද කාර්යාල/ප්‍රාදේශීය කාර්යාලවල ආදායම් බදු ගොනු පවත්වාගෙන යන්නේ නම් නගරබද කාර්යාල/ප්‍රාදේශීය කාර්යාල සඳහාද අවස්ථාවෝචිත පරිදි;

  ගෙනවිත් භාරදීමෙන්, ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑල හරහා භාරදීමෙන් ලියාපදිංචිය ලබාගත හැකිය. කෙසේ නමුත් ඉල්ලීම ඉදිරිපත් කර ඇත්තේ විද්‍යුත් තැපෑල මගින් නම් මුල් අයදුම්පත අදාළ අංශයට එවිය යුතුය.

2. **අනෙකුත් තැනැත්තන්** (බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් නොමැති)

- බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් නොමැති තැනැත්තන් පහත පරිදි බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබාගැනීම අවශ්‍ය වේ;
  - දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ඊ - සේවාව හරහා, හෝ
  - අයදුම්පත්‍රය (TPR_001 හෝ TPR_002) කොමසාරිස්, ප්‍රාථමික ලියාපදිංචි අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 02 හෝ ඕනෑම නගරබද/ප්‍රාදේශීය කාර්යාලයකට භාරදීම මගින්

- ඉන්පසු ඉහත 1 යටතේ දක්වා ඇති උපදෙස් පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචිය ලබාගන්න.
  - **අයදුම්පත්‍රය සමඟ කිසිදු අතිරේක ලේඛන භාරදීම අවශ්‍ය නොවේ.**

## 3. අයදුම්පත්‍ර ආකෘතිය සහ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය

පහත පියවර අනුගමනය කරමින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (www.ird.gov.lk) හරහා, **අයදුම්පත්‍රයේ** අඩංගු කළ යුතු අදාළ අයදුම්පත්‍ර ආකෘති සහ **ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයන්** ලබාගත හැක.

i. අයදුම්පත්‍ර ආකෘති

- බාගත කර ගැනීම

↓

- ආකෘති සහ වාර්තා

↓

- බදු ගෙවන්නා ලියාපදිංචිය

↓

බදු වර්ග ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍රය (SSCL.)
බදු වර්ග ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍රය (සියළු බදු වර්ග සඳහා)
බදු ගෙවන්නා ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර ආකෘතිය (බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබාගැනීමට)

ii. ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර

- ප්‍රයෝජනවත් තොරතුරු

↓

- ආර්ථික ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර

වැඩිදුර තොරතුරු සඳහා පහත නම් සඳහන් ඕනෑම නිලධාරියෙකු අමතන්න.

| | |
|---|---|
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (බදු සේවා) | 0112135300 |
| ජ්‍යෂ්ඨ කොමසාරිස් (බදු සේවා) | 0112134200 |
| ජ්‍යෂ්ඨ කොමසාරිස් (නගර බද/ ප්‍රාදේශීය කාර්යාල ) | 0112503078 |
| කොමසාරිස් (බදු ලියාපදිංචි අංශය) | - 0112134201 |
| | විද්‍යුත් තැපැල – tr@ird.gov.lk |
| කොමසාරිස් (කොළඹ නගර කාර්යාලය) | 0112504390 |
| කොමසාරිස් (මැද කොළඹ කාර්යාලය) | 0112505274 |
| කොමසාරිස් (කොළඹ දකුණ කාර්යාලය) | 0112502564 |
| කොමසාරිස් (මහරගම - නැගෙනහිර කාර්යාලය) | 0112803127 |
| කොමසාරිස් (මහරගම - බටහිර කාර්යාලය) | 0112803125 |
| කොමසාරිස් (අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය) | 0252235512 |
| කොමසාරිස් (බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය | 0552222490 |
| කොමසාරිස් (මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය) | 0652222087 |
| කොමසාරිස් (දඹුල්ල ප්‍රාදේශීය කාර්යාලය) | 0662283655 |
| කොමසාරිස් (ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය) | 0912222504 |
| කොමසාරිස් (ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය) | 0332234246 |
| කොමසාරිස් (යාපනය ප්‍රාදේශීය කාර්යාලය) | 0212222076 |
| කොමසාරිස් (කළුතර ප්‍රාදේශීය කාර්යාලය | 0342222216 |

| | |
|---|---|
| කොමසාරිස් (මහනුවර ප්‍රාදේශීය කාර්යාලය) | 0812223590 |
| කොමසාරිස් (කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය) | 0352222493 |
| කොමසාරිස් (කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය) | 0372222798 |
| කොමසාරිස් (මාතර ප්‍රාදේශීය කාර්යාලය | 0412222933 |
| කොමසාරිස් (මීගමුව ප්‍රාදේශීය කාර්යාලය) | 0312228322 |
| කොමසාරිස් (නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය) | 0522222520 |
| කොමසාරිස් (රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය) | 0452222040 |

## දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

බදු - වඩා හොඳ අනාගතයකට